## 2024-04-01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ඇහැලේපොළ වලව්ව ශ්‍රී දළදා මාළිගාව වෙත පවරා දීම

2024-02-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබ ඇති තීරණයක් පරිදි, ඇහැලේපොළ වලව්ව ශ්‍රී දළදා මාළිගාව වෙත පවරා දීම සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම්ට දැනුම් දී තිබේ. ඒ අනුව, ඉදිරිපත් කර ඇති වාර්තාව මගින්, ඇහැලේපොළ පවුල ප්‍රමුඛ කර ගනිමින් වසර සිය ගණනකට එපිට පැවති මහනුවර රාජධානියේ ශ්‍රී විභූතිය හා එම පරිසර පසුබිම නිරූපණය වන අයුරින් මෙම ගොඩනැගිල්ල තුළ ඉටි රූප කෞතුකාගාරයක් පිහිටුවීමටත්, එමගින්, එම ඉතිහාසය පිළිබඳ තොරතුරු වර්තමාන ජන සමාජය වෙත වඩාත් ආකර්ෂණීය අයුරින් ඉදිරිපත් කිරීමට සහ දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය ඇති කිරීමත් අරමුණු කර ගනිමින් ශ්‍රී දළදා මාළිගාව විසින් ඇහැලේපොළ වලව්ව ආශ්‍රිතව ව්‍යාපෘතියක් සකස් කරනු ලැබ ඇත. එබැවින් අදාළ ගොඩනැගිල්ල ශ්‍රී දළදා මාළිගාව වෙත පවරා දීම සුදුසු බවට නිර්දේශ කර තිබේ. ඒ අනුව, ඇහැලේපොළ වලව්ව සහ ඊට අයත් භූමිය පූජා ඔප්පුවක් මඟින් ශ්‍රී දළදා මාළිගාව වෙත පවරා දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ නොත්‍ර ඩැම් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

බෙංගාල බොක්ක ආශ්‍රිතව සාගර සහ වායුගෝල විද්‍යාව පිළිබඳව පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2024-2028 දක්වා වසර 05ක කාලසීමාවකට වලංගු වන පරිදි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ නොත්‍ර ඩැම් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට යෝජනා වී තිබේ. මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඇතුළු අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන, පර්යේෂණ, උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි සිසුන්ගේ නිපුණතාවන් සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කරනු ලබයි. යෝජිත ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් 62,000ක් වන අතර, ඉන් ඇමෙරිකානු ඩොලර් 60,000ක මුදලක් ඇමෙරිකා එක්සත් ජනපදයේ



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மි E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

නොත්‍ර ඩැම් විශ්වවිද්‍යාලය සහ වොෂිංටන් විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානයක් වශයෙන් ලබා දීමට එකඟතාව පළ කර ඇත. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ නොත්‍ර ඩැම් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය

ශ්‍රී බුද්ධ වර්ෂ 2568 (2024) සඳහා වන රාජ්‍ය වෙසක් මහෝත්සවය, 2024-05-21 දින සිට 2024-05-27 දින දක්වා කාලය වෙසක් සතිය ලෙස ප්‍රකාශයට පත් කරමින්, 'අත්තනො ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච (අනුන් කළ දේ ගැන නොව තමන් කළ දේ ගැන විමසිලිමත් වෙමු)' යන තේමාවෙන් යුතුව, මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වීමට සැලසුම් කර තිබේ. එහි සමාරම්භක උළෙල සහ සමාප්ති උළෙල පිළිවෙළින් මාතලේ ධර්මරාජ පිරිවෙන් පරිශ්‍රයේදී සහ පල්ලෙපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මිල්ලවාන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතය. ඒ අනුව, රාජ්‍ය වෙසක් මහෝත්සවය වෙනුවෙන් සැලසුම් කර ඇති වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කිරීමටත්, 2024 මැයි මස 22, 23 හා 24 යන දිනයන්හි සත්ත්ව ඝාතන හා මස් මාංශ අලෙවි කරන ස්ථාන සහ සුරාසැල් ඇතුළු මත්ද්‍රව්‍ය අලෙවි කරන ස්ථාන වසා තැබීමටත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. ශ්‍රී ලංකාවේ වායුසමන යන්ත්‍රවල බලශක්ති කාර්යක්ෂමතා පරීක්ෂාව සඳහා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම

හරිතාගාර වායු (GHG) විමෝචනය අඩු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වායුසමන යන්ත්‍රවල බලශක්ති කාර්යක්ෂමතා පරීක්ෂාව සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම පිණිස සහාය ලබා දීමට දකුණු කොරියානු රජය විසින් එකඟතාව පළ කර ඇත. කොරියා බලශක්ති කාර්යාංශය හරහා මූල්‍යයනය කරනු ලබන මෙම ව්‍යාපෘතියේ විද්‍යාගාරය ස්ථාපනය කිරීම සහ අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු 2024 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර තිබේ. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව පළ කරමින් දකුණු කොරියානු රජය සහ ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තැබීමට නියමිත සාකච්ඡා සටහන සහ

යොමු කිරීමේ අනුදේශ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ එකඟතාව ලැබී ඇත. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි දෙරට අතර එකඟතාව පළ කිරීමේ සාකච්ඡා සටහනට සහ යොමු කිරීමේ අනුදේශයන්ට අත්සන් තැබීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. උඳු ආනයනය කිරීම සඳහා අවසර ලබා ගැනීම**

ශ්‍රී ලංකාවේ වාර්ෂික උඳු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 20,000ක් පමණ වන නමුත්, එම නිෂ්පාදන වෙළෙඳපොළට ලැබෙන කාල සීමා හේතුවෙන් සෑම වසරකම අප්‍රේල් හා දෙසැම්බර් යන උත්සව මාසවලදී වෙළෙඳපොළ තුළ උඳු හිඟයක් දක්නට ලැබේ. ඒ අනුව, ඉදිරි උත්සව සමයේදී වෙළෙඳපොළ තුළ ඇති විය හැකි උඳු ඇට හිඟය වැළැක්වීම සඳහා සහ උඳු මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා පියවර ගත යුතුව ඇත. එබැවින්, දැනට උඳු ආනයනය කිරීම සම්බන්ධයෙන් පනවා ඇති තාවකාලික තහනම ඉවත් කර 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ පනත මඟින් පනවා ඇති විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්ව, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය හරහා පමණක් දේශීය අවශ්‍යතාව අනුව උඳු ඇට මෙට්‍රික්ටොන් 2,000ක් ආනයනය කිරීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. මෙගාවොට් 1 සිට 5 දක්වා ධාරිතාවන්ගෙන් යුත් මෙගාවොට් 09ක සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර පල්ලෙකැලේ ස්ථාපිත කිරීම**

මෙගාවොට් 07ක සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාර ඉදිකිරීම සඳහා යෝජනා කැඳවීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් 2023-05-22 දින අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඉදිරිපත් වූ යෝජනා ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් සාර්ථක ව්‍යාපෘති යෝජකයින් 04 දෙනෙකු හඳුනාගෙන ඇත. එමෙන්ම, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත නවත් ආයෝජකයෙකුගේ යෝජනාව ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් මෙගාවොට් 05ක සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාරයක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස යෝග්‍ය ආයෝජකයෙකු වශයෙන් අමාත්‍ය

මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් එම ආයෝජකයා ද නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, මූළ ධාරිතාව මෙගාවොට් 09ක් වන පරිදි සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාර ඉදිකර ක්‍රියාත්මක කිරීම පිණිස වන කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ගැසට් නිවේදන ඉදිරිපත් කිරීම

පහත සඳහන් පනත් යටතේ සාදන ලද සහ අදාළ ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමයන්/නියෝග/රෙගුලාසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* අංක 2364/36 දරන 2023-12-31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කළ නියමය.

* අංක 2364/37 දරන 2023-12-31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නිකුත් කළ නියමය.

* අංක 2369/27 දරන හා අංක 2374/19 දරන පිළිවෙලින් 2024-02-01 හා 2024-03-06 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2003 අංක 25 දරන මුදල් පනත යටතේ නිකුත් කළ නියෝග.

* අංක 2368/24 දරන 2024-01-24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2018 අංක 35 දරන මුදල් පනත යටතේ නිකුත් කළ නිවේදනය (මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද).

* අංක 2366/34 දරන 2024-01-12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නිකුත් කළ රෙගුලාසි.

* අංක 2361/44 දරන 2023-12-08 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සුරාබදු ආඥාපනත යටතේ නිකුත් කළ අංක 03/2023 දරන සුරාබදු නිවේදනය.

* අංක 2364/35 දරන 2023-12-31 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සුරාබදු ආඥා පනත යටතේ නිකුත් කළ අංක 04/2023 දරන සුරාබදු නිවේදනය.

* අංක 2366/33 දරන හා අංක 2369/42 දරන පිළිවෙලින් 2024-01-12 හා 2024-02-02 දිනැති අති විශෙෂ ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නිකුත් කළ නියමයන්.

**08. 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 34(1) වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන අනුව, වාර්ෂිකව තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කළ යුතුව ඇත. ක්‍රීඩකයන් සඳහා මෙන්ම ක්‍රීඩාවල යොදවන සතුන්ට ද තහනම් උත්තේජක ද්‍රව්‍ය ලබා දෙන බව වාර්තා වී ඇති බැවින්, මෙම වර්ෂයේ සිට අශ්ව ක්‍රීඩා සහ තුරඟ තරඟ සඳහා ද අදාළ තහනම් උත්තේජක ද්‍රව්‍ය ලැයිස්තුව ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. ඒ අනුව, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන යටතේ අංක 2373/14 දරන 2024-02-27 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2023 අංක 09 දරන තහනම් උත්තේජක (තහනම් කරන ලද ලැයිස්තුව) නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ඇතැම් තෝරා ගත් භාණ්ඩ වර්ග ආනයනය කිරීමේදී පනවනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සංශෝධනය කිරීම බලාත්මක කිරීමට ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් සඳහා එකී පනතේ දක්වා ඇති කාලසීමාව තුළ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ පහත සඳහන් අති විශෙෂ ගැසට් නිවේදනයන් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

* අංක 2360/52 දරන 2023-11-30 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය.
* අංක 2365/04 දරන 2024-01-02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය.
* අංක 2365/84 දරන 2024-01-07 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය.
* අංක 2372/06 දරන 2024-02-19 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය.
* අංක 2373/42 දරන 2024-03-01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය.

**10. සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම සඳහා මෙහෙයුම් කල්බදු යටතේ පුළුල් බඳ සහිත ගුවන්යානා හතරක් (04) ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම සඳහා පුළුල් බඳ සහිත ගුවන්යානා පහක (05) අවශ්‍යතාවයෙන් ගුවන්යානා දෙකක් (02) මෙහෙයුම් කල්බදු යටතේ ලබා ගැනීමේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පිණිස 2024-03-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. තාක්ෂණික

ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අතිරේක ගුවන්යානාවක් සහිතව පහත සඳහන් පරිදි පුළුල් බඳ සහිත ගුවන්යානා හතරක් (04) මෙහෙයුම් කල්බදු යටතේ ලබා ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* ORIX Aviation වෙතින් වසර 06ක කාලසීමාවක් සඳහා මාසිකව ඇමෙරිකානු ඩොලර් 360,000ක බදු කුලියකට ගුවන්යානා 02ක් ලබා ගැනීමට අදාළ කොන්ත්‍රාත්තු.
* Aergo Capital Limited වෙතින් වසර 08ක බදු කාලසීමාවකට මාසිකව ඇමෙරිකානු ඩොලර් 365,000 බදු කුලියකට ගුවන්යානා 02ක් ලබා ගැනීමට අදාළ කොන්ත්‍රාත්තු.

11. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (BIA) සංවර්ධන ව්‍යාපෘතියේ (BIADP) II වන අදියර 2 වන පියවර යටතේ ප්‍රධාන පර්යන්ත ගොඩනැගිල්ල (MTB), මගී පාලම් අංක 02 හා මගී පාලම් අංක 03 ඇතුළත් ව්‍යාපෘතියේ හඳුනාගත් කාර්යය**

2023-10-30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් ඉහත ඉදිකිරීම් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 04ක් ලැබී තිබේ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුව ඉදිරිපත් කළ Access Engineering PLC වෙත අදාළ කාර්යයන් සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත සයික්ලොට්‍රෝන පාදක විකිරණශීලී ඖෂධ නිෂ්පාදන පහසුකමක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම**

දේශීය බැංකුවලින් ලබා දෙන ණය සහ ආධාර සහිතව සයික්ලොට්‍රෝන පාදක විකිරණශීලී ඖෂධ නිෂ්පාදන පහසුකමක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2021-03-29 දින පැවති අමාත්‍ය මණ්ඩල

රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) යන පදනම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අභිප්‍රාය ප්‍රකාශ (EOI) කැඳවා ඇති අතර, ඒ සඳහා යෝජනා 05ක් ලැබී තිබේ. ව්‍යාපෘති කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශ මත පදනම්ව සියලු තාක්ෂණික අවශ්‍යතාවන් සපුරා ඇති යෝජනාව ඉදිරිපත් කරන ලද M/s Access International (Pvt) Ltd වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ සමස්ත ශිෂ්‍ය ජනගහනය මිලියන 04ක් පමණ වන අතර ඒ තුළ වැඩිවියට පත් ශිෂ්‍යාවන් මිලියන 1.2ක් පමණ වන බවට ගණනය කරනු ලැබ ඇත. එම ශිෂ්‍යාවන් අතුරින් අති දුෂ්කර පාසල්, දුෂ්කර පාසල්, හුදෙකලා පාසල්, වතු පාසල් හා දරිද්‍රතා සිසු සිසුවියන් සහිත නාගරික පාසල්වල ඉගෙනුම් ලබන ශිෂ්‍යාවන් 800,000කට 2024 වර්ෂයේ අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂිකව සනීපාරක්ෂක තුවා නොමිලේ ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 14. වතු ජනතාවට ඉඩම් හිමිකම ප්‍රදානය කිරීම

වතු ප්‍රජාව සඳහා සින්නක්කර ඉඩම් ලබා දීම පිණිස විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා 2024 අයවැය යෝජනා මඟින් "වතුකරයේ ජනතාවට ඉඩම් අයිතිය ලබා දීම" යන මැයෙන් යෝජනාවක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහාය ඇතිව ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එම වැඩසටහන යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රජය සතු වැවිලි සමාගම්වලට අයත් වතුවල ජීවත් වන ප්‍රතිලාභීන් 4,151ක් හඳුනා ගනු ලැබ ඇති අතර, එම පවුල් දැනට පදිංචිව සිටින ඉඩම් සඳහා තඩිනමින් සින්නක්කර ඔප්පු ලබා දීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 15. සංචාරක ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම

සංචාරකයන් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරනු ලබන වාහනවල කාලය වසර 06ක් නොඉක්මවීම සාමාන්‍යයෙන් සංචාරක කර්මාන්තය තුළ පිළිගත් සිරිතක් ලෙස සැලකුවද, වාහන සහ අත්‍යවශ්‍ය අමතර කොටස් ආනයනය කිරීම සීමා කිරීම හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කරනු ලබන වාහනවල තත්ත්වය සතුටුදායක හා ප්‍රමාණවත් නොවන බවත්, යල්පැනගිය වාහන භාවිතය හේතුවෙන් ප්‍රමුඛතම සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව අත්කර ගෙන සිටින කීර්ති නාමයට යම් හානියක් සිදු කරන බවත් පෙනී ගොස් ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවන ක්‍රියාවලිය තුළ සංචාරක කර්මාන්තයේ දායකත්වය සැලකිල්ලට ගනිමින් එකී කර්මාන්තයේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වාහන ආනයනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, විශේෂ බදු සහන ලබා දීමකින් තොරව විශේෂයෙන්ම සංචාරකයන් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කිරීම පිණිස ආසන 6 - 15 වෑන් රථ (විදුලි සහ දෙමුහුන් රථ ඇතුළුව) 750ක් සහ ආසන 16-30 කුඩා ප්‍රමාණයේ බස් රථ හා ආසන 30-45 බස් රථ 250ක් ආනයනය කිරීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************